# නාවලපිටිය නගර සභාව
# මහනුවර දිස්ත්‍රික්කය

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය.

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

--------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

----------------------------------------------

නගර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.25,482,726 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.17,411,531 ක් විය. 2014 ජූලි 15 දින වන විට මෙම මුදලින් තවදුරටත් රු.16,936,530 ක් අය නොවී පැවතුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.26,839,705 ක් වූ අතර, එයින්, රු.12,483,288 ක් අවුරුදු 01 ට වැඩි ශේෂයකින් සමන්විත වී තිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,376,377 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,729,837 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.2,646,540 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය.**

**--------------------------------------**

**සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තයට වඩා රු.8,337,250 ක වැඩිවීමක් වූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේ දි ආදායම් විෂයයන් 04 ක සියයට**

**16 සිට 34 දක්වා වූ සමස්තය වැඩිවීම හා වියදම් විෂයයන් 02 ක සියයට 21 සිට සියයට 44 දක්වා පරාසයකින් අඩුවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**---------------------------------**

**මුළු ජංගම වත්කම් සහ ජංගම වගකීම් අතර අනුපාතය 2.5:1 ක් ලෙස ප්‍රශස්ථ මට්ටමක පැවති අතර, ජංගම වත්කම්වලින් සියයට 50 ක් ආදායම් ණයගැතියන්ගෙන් සමන්විත වී තිබුණි. ජංගම වගකීම්වලින් සියයට 63 ක් ණයහිමියන්ගෙන් සමන්විත වී තිබූ අතර, එයින් සියයට 61 ක ප්‍රමාණයක් කර්මාන්ත ණයහිමියන්ගෙන් යුක්ත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය.**

**----------------------**

**(අ) වරිපනම් බදු**

**--------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(i) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි, රු.11,236,364 ක හිගයක් පැවති අතර, එයින් වර්ෂය තුළ අය වී තිබුණේ රු.4,003,455 ක් හෙවත්, සියයට 36 ක් පමණි.**

**(ii) වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම් රු.12,991,212 ක් වූ අතර, එයින් අය කර ගෙන තිබූ මුදල රු.7,483,715 ක් හෙවත්, සියයට 57 ක් විය.**

**වර්ෂය අවසානයේ සමස්ත හිගය රු.12,740,406 ක් වූ අතර, සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන වරිපනම් බදු අය කර ගැනීමට නගර සභා පනතේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.**

**(ආ) බදු කුළී.**

**------------**

**2013 දෙසැම්බර් 31 දිනට සමස්ත කඩ කුළී හිගය රු.3,318,866 ක් විය. මෙම අගයෙන් රු.1,611,091 ක් සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩවලින් අය වියයුතු හිග මුදල් විය. මෙම හිග මුදල තුළ 2011 වර්ෂයේ සිට කඩ බදුකරුවන් 25 දෙනෙකුගෙන් අය විය යුතු රු.481,159 ක් ද, 2012 වර්ෂයට කඩබදුකරුවන් 40 දෙනෙකුගෙන් අය විය යුතු රු.350,282 ක් ද, ඇතුළත් විය. මෙම මුදල් අය කර ගැනීමට වගකිවයුතු නිලධාරින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.**

**(ඇ) වාහන නවතා තැබීමේ ගාස්තු.**

**--------------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට වාහන නවතා තබන ස්ථානවලින් අය වියයුතු හිග මුදල රු.642,350 ක් විය.**

**පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(i)** **වෑන් රථ නැවතුම් පොළවලින් ගාස්තු බිල් කිරීම් රු.511,200 ක් වු අතර, වර්ෂය තුළ අය කර ගෙන තිබුණේ රු.135,600 ක් හෙවත් සියයට 26 ක් පමණි.**

**(ii)** **ලොරි රථ නැවතුම් පොළවලින් ගාස්තු බිල් කිරීම් රු.384,000 ක් වු අතර, වර්ෂය තුළ අය කර ගෙන තිබුණේ රු.253,600 ක් හෙවත් සියයට 66 ක් පමණි.**

**(iii)** **ත්‍රී රෝද රථ නැවතුම් පොළවලින් ගාස්තු බිල් කිරීම් රු.2,905,200 ක් වු අතර, එයින්, රු.2,660,850 ක් අය කර ගෙන තිබුණි. තවදුරටත් අය කර ගතයුතු ප්‍රමාණය සියයට 08 ක් විය.**

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**---------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.162,831 ක් හා මුද්දර ගාස්තු රු.1,687,650 ක් ලැබියයුතුව පැවතුණි. 2014 මැයි 30 දින වන විට තවදුරටත් රු.342,000 ක මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් අය නොවී පැවතුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**---------------------------------------**

**2011 සැප්තැම්බර් 22 දින රු.41,997 ක් අඩුවෙන් බැංකුවේ තැන්පත් කිරීම සම්බන්ධයෙන් 2014 ජූනි 30 දින වන විටත් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.**

**3.2 ආර්ථික නොවූ ගනුදෙනු.**

**------------------------**

**ජපානයේ පැවැත් වූ සාමය සඳහා වූ නගරාධිපතිවරුන්ගේ 08 වන සමුළුවට සභාපතිවරයා හා උප සභාපතිවරයා සහභාගී වී තිබූ අතර, ඒ සඳහා සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන් නොකර, සභා අරමුදලින් රු.892,807 ක් වැය කර තිබුණි. තව ද, මෙම සමුළුවේ අරමුණ 2020 දි න්‍යෂ්ඨික අවි තුරන් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම වූ බැවින්, සහ ලංකාවේ න්‍යෂ්ඨික අවි භාවිතයක් නොතිබිය දි, මෙතරම් මුදලක් සභා අරමුදලින් වැය කිරීම තුළින් 2020 වන විට ද, සභාවට ලැබෙන ප්‍රතිලාභ විගණනයට අනාවරණය නොවුණි.**

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

---------------------------------------

**4.1** අයවැය පාලනය.

-------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අයවැය ලේඛනය හා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තථ්‍ය වටිනාකම සමග සැසඳීමේ ආදායම් සියයට 22 සිට සියයට 103 ක් හා වියදම් සියයට 33 සිට සියයට 102 ක් දක්වා පරාසායක විචලනයක් නිරීක්ෂණය විය.

**4.2** අභ්‍යන්තර විගණනය.

-------------------------

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.3** විගණන හා කළමනාකරණ කමිටු.

--------------------------------------

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

**5.** පද්ධති හා පාලන.

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවැය පාලනය.

(ඇ) ආදායම් පරිපාලනය.

(ඈ) වත්කම් කළමනාකරණය.